සියලු ම හිමිකම් ඇවිරිණි
[illegible]
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

# වර්ෂ අවසාන ඇගයීම
# ஆண்டிறுதி மதிப்பீடு - 2020
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න — විභාග අංකය ..............................

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



ඉහත දක්වෙන සිතුවම ලාංකේය බෞද්ධ පුනරුදය සඳහා මහඟු සේවයක් ඉටු කළ (1) ................................................. යුගයට අයත් චිත්‍ර ශිල්පියෙකු වන (2) ........................................... මහතා විසින් ඇඳ ඇත. මෙම සිතුවම (3) ........................................ යනුවෙන් නම් කර ඇත. විහාර සිතුවම් කලාවේ නව සම්ප්‍රදායක් ඇති කළ මෙම ශිල්පියාගේ සිතුවම් වල (4) ........................................ චිත්‍ර කලාවෙ ආභාසය දක්නට ලැබීම විශේෂත්වයකි. මෙම ශිල්පියාගේ චිත්‍ර නිර්මාණ විහාර සිතුවම් හා (5) ............................................. සිතුවම් වශයෙන් කොටස් දෙකකි.

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(06) මහාචාර්ය සෙනරත් පරණවිතාන ශූරීන්ගේ මතයට අනුව සඳකඩ පහණේ අඩ නෙළුමෙන් සංකේතවත් වන අර්ථය කුමක්ද?

..........................................................................................................................................

(07) සබන් කැටයක් භාවිත කර සත්ව රූපයක් නිර්මාණය කිරීමේදී අනවශ්‍ය කොටස් ඉවත් කර රූපය මතුකර ගැනීම සිදුවේ. මේ සඳහා භාවිත ශිල්ප ක්‍රමය හඳුන්වන නම කුමක්ද?

..........................................................................................................................................

(08) මයිකල් ආන්ජලෝ විසින් නිර්මාණය කරන ලද "ආදම් මැවීම" සිතුවම දක්නට ලැබෙන්නේ කොහේද?

..........................................................................................................................................

(09) මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ සිතුවම් ඇඳි චිත්‍ර ශිල්පියා කවුරුන්ද?

.......................................................................................................

(10) ලංකාවේ ප්‍රථම චිත්‍ර කතාව නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?

.......................................................................................................

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

(11) මහනුවර යුගයේ සිතුවම්වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් <u>නොවන්නේ,</u>

(1) අඛණ්ඩ කථන ක්‍රමය (2) පැතලි වර්ණ භාවිතය

(3) බෞද්ධ වස්තු විෂයක් තෝරා ගැනීම (4) බහුවර්ණ භාවිතය

(12) II වැනි ජුලියස් පාප්තුමාගේ සොහොන් ගෙය නමැති කිරිගරුඬ මූර්තිය කාගේ නිර්මාණයක් ද?

(1) මයිකල් ආන්ජිලෝ ගේ නිර්මාණයකි (2) හෙන්රි මුවර් ගේ නිර්මාණයකි

(3) රෆායල් සන්සියෝ ගේ නිර්මාණයකි (4) ලියනාඩෝ ඩාවින්චි ගේ නිර්මාණයකි

(13) චිත්‍රයක දුර සහ ළඟ දැක්වීමේ දී සිද්ධාන්තය හඳුන්වන්නේ,

(1) ත්‍රිමාණ ලක්ෂණ නමිනි (2) පර්යාවලෝකනය නමිනි

(3) සම්පිණ්ඩනය නමිනි (4) ද්විමාණ ලක්ෂණ නමිනි

(14). හින්දු බැතිමතුන් "ගණේෂ" නමින් හඳුන්වන දෙවියන්,

(1) කලාවට අධිපති දෙවියන් ලෙස සැලකේ

(2) යුද්ධයට අධිපති දෙවියන් ලෙස සැලකේ

(3) ප්‍රේමයට අධිපති දෙවියන් ලෙස සැලකේ

(4) ඥාණයට අධිපති දෙවියන් ලෙස සැලකේ

(15) ග්‍රැෆික් සැලසුම් ගණයට අයත් ලාංඡන නිර්මාණය කිරීමේදී ඔබ විසින් වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) දීප්තිමත් වර්ණ භාවිතා කිරීම කෙරෙහිය.

(2) සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර බහුලව භාවිතා කිරීම කෙරෙහිය.

(3) පැහැදිලි බව, සරල බව සහ සංකේත අර්ථය නිරූපණය කිරීම කෙරෙහිය.

(4) සංකීර්ණ හැඩතල හා නිර්මාණාත්මක අක්ෂරකරණය කෙරෙහිය.

- ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

(16) හංගිඩියන් : ..........................................................

(17) පංචනාරි ඝටය : ..........................................................

(19) ප්‍රැක්සිටෙලස් : ..............................................................................................


(20) නෙබාමුන් : ..............................................................................................

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූපවලට ගැලපෙන රූපය **A, B, C, D, E** යන රූප අතුරෙන් තෝරා අදාල ඉංග්‍රීසි අක්ෂරය රූපය ඉදිරියේ ඇති වරහන තුල ලියන්න.

(21)  (.............)

A 

(22)  (.............)

B 


(23)  (.............)

C 

(24)  (.............)

D 

(25)  (.............)

E 

- අංක 26 සිට 30 තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු වචනය / වචන යොදා සම්පූර්ණ කරන්න.

(26) නයිල් ගංගාධාරය පදනම් ව ව්‍යාප්ත වූ ඉතා විශිෂ්ට වූ සංස්කෘතියකට හිමිකම් කියන ඊජිප්තු ශිෂ්ටාචාරය පාලනය කරන ලද්දේ ........................................... නමින් හැඳින්වෙන රාජකීය පරම්පරාව විසිනි.


(27) පැරණි වාස්තු ශිල්පියාගේ ශිල්පීය දක්ෂතාව විදහා දක්වමින්, එක් දව ඇණයකින් පරාල විසිහයක් රඳවා ඇති ඇම්බැක්ක දේවාලයේ පියස්සේ ඇති නිර්මාණ අංගය ................................... ලෙස හැඳින්වේ.

(28) ගෙඩිගේ නම් වූ වෘත්තාකාර පියස්සකින් සමන්විත වූ ගම්පල යුගයට අයත් ගඩලාදෙනි විහාරයේ දක්නට ලැබෙන ගෘහ නිර්මාණ ලක්ෂණ ............................................... සම්ප්‍රදායකට අයත් වේ.

(29) කාන්තාවන් හතර දෙනෙකුගේ රූප දෝලාවක හැඩයට සම්පිණ්ඩනය කොට කරන ලද නිර්මාණය ............................................. නම් වේ.

(30) සත්ව රූප හතක් ඇසුරින් නිර්මාණය කළ "මකරා" නැමති කල්පිත සැරසිල්ලේ පාද නිර්මාණය කර ඇත්තේ ............................................ගේ පාද ඇසුරෙනි.

- අංක 31 සිට 35 තෙක් දී ඇති ප්‍රශ්න වලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.



F G H I J

(31) F අක්ෂරයෙන් දැක්වෙන ස්ථානය කුමක්ද? .......................................................

(32) G අක්ෂරයෙන් දැක්වෙන සිතුවම දක්නට ඇත්තේ කොහේද? .......................................................

(33) H අක්ෂරයෙන් දැක්වෙන මුද්‍රාව නිරූපිත බුදු පිළිමයක් නම් කරන්න. .......................................................

(34) I අක්ෂරයෙන් දැක්වෙන චිත්‍ර කතාව ඇඳි ශිල්පියා කවරෙක්ද?.......................................................

(35) J අක්ෂරයෙන් දැක්වෙන මූර්තිය අයත් වන යුගය කුමක්ද? .......................................................

- පහත දක්වෙන නිර්මාණය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක 36 සිට 40 තෙක් දී ඇති උපමාතෘකා වලට අදාලව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



(36) හඳුනාගත් බව : ..........................................................................................................

(37) තේමාව : ..........................................................................................................

(38) මාධ්‍යය : ..........................................................................................................

(39) ශිල්පීය කුසලතාව : ..........................................................................................................

(40) සංරචනය : ..........................................................................................................

(ලකුණු 1X 40 = 40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි.

- ඔබේ විභාග අංකය/ නම, පාසල හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට දෙන විට වියළී තිබිය යුතු ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ආදී අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකි ය.

නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රළු කඩදාසියක් මත රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් වර්ණ කිරීමට සුදුසු චිත්‍ර කඩදාසියක ඇඳ වර්ණ ගන්වන්න.

- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍ර ඇගයීමේ දී පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් වේ.

    1. රේඛා අධ්‍යයනයේ දී දක්වන කුසලතාව
    2. වර්ණ භාවිතය

- ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
- පරිමාණය, පර්යාලෝක රීති, ත්‍රිමාන ලක්ෂණ දැක්වීම.
- දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ලක්ෂණ හා ගති ලක්ෂණ දැක්වීම.
- උචිත පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව.

සැලකිය යුතුයි.

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

(ලකුණු 30)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | III | කාලය / காலம் / Time | පැය 02 |
|---|---|---|---|---|---|---|---|

<u>සැලකිය යුතුයි.</u>

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය/ නම, පංතිය හා අදාළ ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසු පිටේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට දෙන විට වියළී තිබිය යුතු ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ආදී අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකි ය.

- "අ" හෝ "ආ" යන කොටසින් හෝ "ඉ" යන කොටසින් එක් මාතෘකාවක් තෝරාගන්න.

"අ" කොටස - සංරචනය

1. සිරිපා වන්දනාවේ යන බැතිමතුන්
2. වනෝද්‍යානයක් තුළ අනතුරක ඉව වැටුණු මුව රංචුවක්
3. දොළක දිය නාන ගමේ කොලු පැටවු
4. කෙතේ ගොයම් කැපුමට සැරසෙන ගෙවිලියන්

හෝ

"ආ" කොටස - ග්‍රැෆික්

5. "කොවිඩ් 19 පරදවමු." තේමාව යටතේ වර්ණවත් පෝස්ටරයක් නිර්මාණය කරන්න.
6. "ළඳරු ඇඳුම් මෝස්තර" යන මැයෙන් පොත් පිටකවරයක් නිර්මාණය කරන්න.
7. පාසලේ චිත්‍ර සංගමය මගින් පවත්වනු ලබන චිත්‍ර ප්‍රදර්ශනය සඳහා ආරාධනා පත්‍රයක් සැලසුම් කරන්න.

හෝ

"ඉ" කොටස - මෝස්තර

8. ස්වභාවික මල් හා කොළ ඇසුරු කරගෙන චීත්ත රෙද්දක් සඳහා මෝස්තරයක් නිර්මාණය කරන්න.
9. ජ්‍යාමිතික හැඩතල ඇසුරෙන් සත්ත්ව හැඩ නිර්මාණය කර සරොම් වාටියකට සුදුසු සැරසිල්ලක් ඇඳ වර්ණ කරන්න.
10. චතුරස්‍රාකාර කුෂන් කවරයක් සඳහා වෘත්ත හැඩතල භාවිතයෙන් මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න. (ලකුණු 30)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

ශාලාධිපතිවරුන්ට / චිත්‍ර කලා ගුරුභවතුන්ට උපදෙස්

නිදහස් රේඛාමය ඇඳීම හා නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය

- පහත දක්වෙන සටහනට අනුව ද්‍රව්‍ය සමූහය හා පැළැටිය ඇස් මට්ටමට පහතින් සිටින සේ පිළියෙළ කරන්න.
- ද්‍රව්‍ය සමූහයේ සිට මීටර් 2 ක් ඈතින් අර්ධ කවාකාරව පිළියෙළ කරන ලද ආසනවල සිසුන් වාඩි කරවන්න.
- එක් කණ්ඩායමක අයදුම්කරුවන් 15 දෙනෙකුට වඩා වැඩි නොවිය යුතුය.
- පෙනී සිටින අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව කණ්ඩායම් එකක් හෝ ඊට වැඩි ගණනක් පිළියෙළ කරන්න.
- චිත්‍රය ඇඳීම සඳහා අවශ්‍ය කඩදාසි සහ වර්ණ සපයා ගැනීමට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.

අවශ්‍ය ද්‍රව්‍ය

- සාමාන්‍ය ප්‍රමාණයේ කාඩ්බෝඩ් පෙට්ටියක්
- වර්ණවත් මල් සහිත චිත්ත රෙදි කැබැල්ලක් (මීටර් 1/2 පමණ)
- වීදුරු බෝතලයක් (අඩක් ජලය පිරවූ)
- තැඹිලිගෙඩියක්
- පළල් කොළ සහිත වර්ණවත් ක්‍රෝටන් අත්තක් (කොළ පහක් පමණ සෑහේ)
- සාමාන්‍ය ප්‍රමාණයේ කළයක්
- ද්‍රව්‍ය සමූහය තැබීමට සුදුසු ධාරකයක්



සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**மேல் மாகாணக் கல்வித் திணைக்களம்**
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| ශ්‍රේණිය / தரம் / Grade | 10 | විෂයය / பாடம் / Subject | චිත්‍ර කලාව | පත්‍රය / வினாத்தாள் / Paper | I |
|---|---|---|---|---|---|

(01) කොළඹ / නූතන
(02) එම්.සාර්ලිස් / ඇම්. සාර්ලිස්
(03) පියුම් පිට වැඩීම
(04) යුරෝපීය / බටහිර / අපරදිග
(05) ලිතෝ මුද්‍රිත
(06) නිවන
(07) නෙලීම
(08) රෝමයේ සිස්ටයින් දෙව්මැදුරේ
(09) ඩේවිඩ් පේන්ටර්
(10) ජී.එස්. ප්‍රනාන්දු
(11) (4) බහුවර්ණ භාවිතය
(12) (2) මයිකල් ආන්ජිලෝ ගේ නිර්මාණයක්
(13) (2) පර්යාවලෝකනය නමිනි
(14) (IV) ඥාණයට අධිපති දෙවියන් ලෙස සැලකේ
(15) පැහැදිලි බව, සරල බව හා සංකේතාර්ථ නිරූපණය කෙරෙහි
(16) මහනුවර යුගයේ දී ලාක්ෂා කාර්මිකයන් හඳුන්වනු ලැබූ නාමය වේ.
(17) කාන්තා රූප පහක් භාවිතා කර කළයක හැඩයට නිර්මාණය කරන ලද සැරසිල්ලකි.
(18) කිසියම් ගද්‍යයක හෝ පද්‍යයක අන්තර්ගතය තීව්‍ර කර දැක්වීමට අඳින ලද සිතුවම් ය.
(19) ග්‍රීක මූර්ති අතර ඇති හර්මීස් සහ ඩයොනීසස් හි නිර්මාණ ශිල්පියා ය.
(20) ඊජිප්තු (මිසර) නිර්මාණ අතර ඇති කුරුලු දඩයම සිතුවම ඇඳ ඇති සොහොන් ගැබ
(21) E
(22) D
(23) A
(24) C
(25) B
(26) පාරාවෝ
(27) මඩොල් කුරුපාව / කැණිමඬල
(28) දකුණු ඉන්දීය විජය නගර්
(29) චතුර් නාරි පල්ලැක්කිය
(30) සිංහයෙකු
(31) තිරියායි වටදාගෙය
(32) බිල්ලෑව
(33) සාරානාත් බුදු පිළිමය
(34) බන්දුල හරිස්චන්ද්‍ර
(35) හෙලනිස්ටික යුගය
(36) ඇම්බැක්කේ දේවාලයේ කුළුණු කැටයම් අතර දක්නට ඇති කැටයමකි
(37) මෙම කැටයමින් දේශීය හේවාකරුවකු නිරූපිත ය. / මෙම කැටයමින් කාලීන තේමාවක් ඉස්මතු කර ඇත.
(38) ද්‍රව මාධ්‍යයෙන් නෙළීමේ ශිල්ප ක්‍රමයට අල්ප උන්නතව නෙළන ලද්දකි.
(39) මාධ්‍යයේ ස්වභාවය රැකෙන පරිදි ඉතා සියුම් කැටයම් නිර්මාණය කර තිබීම ශිල්පියාගේ කුසලතාව විදහා දක්වන්නකි.
(40) චතුරස්‍රාකාර පනේලයක මානව රූප සහිත සිද්ධිය මනාව නිරූපණය කර ඇත.

(ලකුණු 1 x 40 = 40)